## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - 2018

---------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 1.5 කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 වෙනි පරිච්ඡේදයේ සඳහන් කරුණු සඳහා මගේ මතය තත්ත්වාගණනය කරන ලදි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,
- බැංකුව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| (අ) හිමිකම් වවුචර් ගිණුමේ (Claim Voucher Account ) නිවැරදි නොකළ වසර 3 ක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 13,651,821 ක අසාමාන්‍ය බැර ශේෂයක් දක්නට ලැබුණු අතර එම අසාමාන්‍ය බැර ශේෂයට හේතු හඳුනාගෙන නොමැත. එසේම හලාවත ශාඛාවේ සහ කුරුණෑගල ශාඛාවේ වසර 2 ක සිට පවතින නිරවුල් නොකරන ලද පිළිවෙලින් රුපියල් 1,996,000 ක සහ රුපියල් 1,030,374 ක ශේෂයක් දක්නට ලැබුණි. | හලාවත ශාඛාවේ සහ කුරුණෑගල ශාඛාවේ ඇති නොසැසඳුණු වෙනස්කම් මෙ වනවිට ඉවත් කර ඇති අතර, මහනුවර ශාඛාවේ ශේෂයන් ඉවත්කරමින් පවතී. | මහනුවර ශාඛාවේ ශේෂයන් ද ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට වතු අර්ථසාධක අරමුදල් ණය ශේෂයට අදාල ලැබිය යුතු පොළී අදායම් සම්බන්ධව ලෙජරයේ දැක්වෙන ශේෂය සහ ණය උපලේඛණ ශේෂය අතර රුපියල් 8,088,496 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | සාමාන්‍ය ලෙජරය සහ ණය උපලේඛණ අතර ඇති වෙනස්කම් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) චෙක්පත් උපලබ්ධි ගිණුමේ (Cheques on Realization Account) සැලකිය යුතු කාලයක සිට නිවැරදි නොකර ඉදිරියට ගෙන එමින් පවතින රුපියල් 8,137,376 ක අසාමාන්‍ය හර ශේෂයක් දක්නට ලැබුණු අතර එම ශේෂයෙන් රුපියල් 7,885,705 ක අසාමාන්‍ය හර ශේෂයක් වසර 5ක සිට අඛණ්ඩව පවතී. මෙම අසාමාන්‍ය හර ශේෂයට හේතු හඳුනාගෙන නොමැත. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) නුවර ශාඛාවේ 2018 වර්ෂය තුළ චෙක්පත් උපලබ්ධි ගිණුමේ අසාමාන්‍ය හර ශේෂය නිවැරදි කිරීමේ සටහන වරදවා ගිණුම් ගත කිරීම හේතුවෙන් එම ගිණුමේ අසාමාන්‍ය හර ශේෂය රුපියල් 2,702,521 කින් අවතක්සේරු වී ඇත. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) එකතු කල අගය මත බද්ද (VAT), ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT), ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) සහ ආදායම් බද්ද (Income Tax) සත්‍ය ලෙස ගෙවූ වටිනාකමට වඩා රුපියල් 24,652,323 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායාම් ලෙස වාර්තා කර තිබුණි. එසේම ලාභාංශ ආදායම් | 2018 න් අවසන් වූ වර්ෂය සඳහා බදු වැඩි ගෙවීමක් හෝ අඩු ගෙවීමක් සිදු නොවූ අතර, ඉහත වෙනස්කම් වලට හේතුව වන්නේ 2019 දෙසැම්බර් | 2019 දෙසැම්බර් වලින් අවසන් වූ වර්ෂය සඳහා උපචිත බදු ගැළපීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා කර ඇත්තේ රුපියල් 3,090,360 ක රඳවාගැනීමේ බදු අඩු කිරීමෙන් තොරවය. | වලින් අවසන් වූ වර්ෂය සඳහා උපචිත බදු නොගැළපීමයි. | |
| (ඊ) 2018 දෙසැම්බර් 31 දිනට අන්තර් ශාඛා ගිණුම්වල රුපියල් 4,296,607 වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස්කම් මේ වනවිට ඉවත් කර ඇත. | |
| (උ) උපචිත සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ සහ උපචිත සේවක භාරකාර අරමුදල් ගිණුමේ වසර 12 සිට පැවත එන රුපියල් 3,008,166 ක නිරවුල් නොකරන ලද ශේෂයක් දක්නට ලැබුණි. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඌ) නුවර ශාඛාවේ සහ හැටන් ශාඛාවේ වරදවා ගිණුම් තැබීම හේතුවෙන් වතු අංශ ණයවාරික ගිණුමේ පිළිවෙලින් රුපියල් 2,499,034 ක සහ රුපියල් 303,814 ක අසාමාන්‍ය හර ශේෂයක් දක්නට ලැබුණි. | හැටන් ශාඛාවේ රුපියල් 303,814 ක වැරදි හර ශේෂය මෙ වනවිට නිවැරදි කර ඇත.<br>මහනුවර ශාඛාවේ වැරදි හර ශේෂය 2019 අවසානයට පෙර ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | මහනුවර ශාඛාවේ අසාමාන්‍ය හර ශේෂය ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (එ) ශාඛා ඇඩ්වයිස් ගිණුමේ (Branch Advice Account) සැලකිය යුතු කාලයක සිට නිවැරදි නොකර ඉදිරියට ගෙන එමින් පවතින රුපියල් 2,508,640 ක අසාමාන්‍ය හර ශේෂයක් දක්නට ලැබුණු අතර එම ශේෂයෙන් රුපියල් 2,489,500 ක හර ශේෂයක් වසර 3 ක සිට පවතී. මෙම අසාමාන්‍ය හර ශේෂයට හේතු හඳුනාගෙන නොමැත. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ශාඛා ඇඩ්වයිස් ගිණුමේ (branch advice account) ඇති රුපියල් 2,508, 640 හි අසාමාන්‍ය හර ශේෂය ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඒ) මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ණයගැතියන් යටතේ රුපියල් 2,400,000 ක වංචා ගිණුමක් වාර්තා වී තිබුණු අතර එම වටිනාකම 1999 වර්ෂයේදී සිදු වූ වංචාවන් දෙකක් සම්බන්ධයෙන් වේ.කෙසේ නමුත් මෙම ශේෂයන් අයකර ගැනිම අවිනිශ්චිත සහගත වේ. | ඉහත වංචාවන්හි නැවත අයකර ගැනීමේ හැකියාව ඉතා දුෂ්කර බැවින් 2019 දෙසැම්බර් අවසානයට පෙර කපා හැරීමට පියවර ගනු ලැබේ. | බැංකුවේ නීති අංශයෙන් මෙම වටිනාකම අයකර ගැනීමේ නොහැකියාව තහවුරු කරගැනීමෙන් අනතුරුව කපා හැරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඔ) ප්‍රධාන කාර්යාලයේ බදුකුලී අත්තිකාරම් ගිණුමේ ඉදිරියට ගෙනා රුපියල් 1,615,152 ක හඳුනා නොගත් බැර ශේෂයක් දක්නට තිබුණි. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඕ) මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ණයගැතියන් යටතේ සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් උපචිත සහයක ගිණුමේ (Accrued Assistant to Provident Fund Account) රුපියල් 1,512,882 ක අයකර ගත නොහැකි හර ශේෂයක් වසර දෙකක කාලයක සිට හෙළිදරව් විය. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඔ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබූ ණය ශේෂය සඳහා , 2018 දෙසැම්බර් 26 සිට 2018 දෙසැම්බර් 31 කාලසීමාවට අදාලව ගෙවියයුතු පොලීය රුපියල් 818,630 කින් වැඩියෙන් හඳුනාගෙන තිබුණි. | මේ වනවිට නිවැරදි කර ඇත | |
| (ක) බැංකුව විසින් ස්ථාවර වත්කම් යටතේ හෙළිදරව් කර තිබූ වාහන, ලීබඩු හා උපකරණ ඒවායේ ස්වභාවය අනුව වර්ගකර නොතිබුණි. | අනාගත වාර්තාකරණයේදී අනුකූල වීමට කටයුතු කරනු ලැබේ. | LKAS 16 ට අනුව දේපල උපකරණ කාණ්ඩගත කර අනාවරණය කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් සහ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වත්කම් යටතේ සඳහන් ව ඇති නොසැසඳු පාලන ගිණුමේ (Un-Reconciled Control Account) ඉදිරියට ගෙන එන ලද රුපියල් 12,772,657 ක හර ශේෂයක් හෙළිදරව් කර තිබුණි. මෙම ශේෂය හටගෙන තිබුනේ 2016 සිට 2018 කාලසීමාව තුලදී අදාළ ලෙජර් ගිණුම් වලින් නොසැසඳු පාලන ගිණුමට නොසැසඳු වෙනස්කම් මාරුකිරීම හේතුවෙනි. ඊට අදාළ ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2019 අවසානයට පෙර ඉහත වෙනස ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත වෙනස ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් 889,881,994 ක් වූ අක්‍රීය පුද්ගලික ණය ශේෂයෙන් රුපියල් 19,598,126 ක් දක්වා වූ ණය ප්‍රධාන අක්‍රීය ගනුදෙනුකරුවන් 12 ක් නියෝජනය කරයි. පැහැර හරින අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණද, එමඟින් කිසිදු වාරිකයක් අය කර ගැනීමට 2018 වර්ෂය තුළදී බැංකුවට නොහැකි විය. | 2018 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක ණය (EPF) මුදලේ අක්‍රීය ණය අනුපාතය (NPL) සියයට 65 කි. අර්ථසාධක ණය (EPF) සම්පූර්ණයෙන් මුදල් ආපසු ලැබීමේ වත්කමක් ලෙස සලකනු ලබන අතර, එම (EPF) ණයවල හිඟ මුදල් වාර්ෂිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබා ගත හැකි බැවින් අර්ථසාධක ණය (EPF) හි ඉහළ අක්‍රීය ණය අනුපාත (NPL) අගයේ කිසිදු බලපෑමක් නැත. | අක්‍රීය ණය ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ ගනුදෙනුකරුවන් සමඟ පසු විපරම් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු කල යුතුය. |

(ආ) බැංකුවේ සමස්ත ණය කළඹට පිළිවෙලින් පුද්ගලික ණය, උකස් ණය සහ අර්ථසාධක ණය පිළිවෙලින් සියයට 42, සියයට 24 සහ සියයට 18 ක් දායක වේ. ඉහත ප්‍රධාන කාණ්ඩ තුනෙහි අක්‍රීය ණය අනුපාත 2018 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 6, සියයට 9 සහ සියයට 65 ලෙස සටහන් වී ඇත. අනෙකුත් ණයවල අක්‍රීය ණය අනුපාතවලට සාපේක්ෂව අර්ථසාධක ණයෙහි ඉහළම අක්‍රීය ණය අනුපාතයක් නිරීක්ෂණය විය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 03/2016. | බැංකුව විසින් සිය සේවකයින්ගේ වැටුපෙන් අඩු කිරීම වෙනුවට තමන්ගේම අරමුදල් වලින් 2018 වර්ෂය සඳහා රුපියල් 20,159,760 ක උපයනවිට බදු ගෙවීම් (PAYE බද්ද) ගෙවා ඇත. | සාමූහික ගිවිසුමේ විධිවිධාන අනුව සේවකයින්ගේ උපයනවිට උපයනවිට බදු (PAYE ) ගෙවීම් බැංකුව විසින් දරනු ලැබේ. | බැංකුවේ උපයනවිට (PAYE බද්ද) ගෙවීම් සඳහා “2016 අප්‍රේල් 29 දිනැති රාජය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 03/2016” පළිපැදිය යුතුය. |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2006 | | | |
| 5.1.1 වගන්තිය | තාක්ෂණික පිරිවිතරයන්, සැලසුම් යනාදිය ඇතුළත් කර ලංසු ලේඛන නිසි පරිදි සකස්කිරීමට බැංකුව අපොහොසත් විය. | මේ වනවිට නිවැරදි කර ඇත. | |
| 6.3.3 වගන්තිය | ලංසු විවෘත කිරීමේ කමිටුව පත් කර නොතිබුණ අතර ලංසු විවෘත කිරීමේ ක්‍රියා පටිපාටිය නිසි ලෙස අනුගමනය කර නොතිබුණි. | ලංසු විවෘත කිරීමේ කමිටුව 2019.06.26 දින සිට ක්‍රියාත්මක වේ | බැංකුවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා “ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006” පළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| 7.1 වගන්තිය | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1 වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමට ලක් කර නොතිබුණි. | කාර්යාල වෙන් කිරීමේ කාර්යයේ වටිනාකම ප්‍රමාණාත්මක නොවන බැවින් මෙය වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයයටතේ සිදු කර ඇත. | බැංකුවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා ‘‘ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006’’ පළිපැදිය යුතුය. |
| 8.9.1 වගන්තිය | විධිමත් කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමේදී විධිමත් පිළිගැනීමේ ලිපියක් බැංකුව සහ ලංසුකරුවන් අතර ඇතුළත් කර නොතිබුණි. | තෝරාගත් ලංසුකරුට විධිමත් ප්‍රදානය කිරීමේ ලිපියක් ලෙස බැංකුව පෙර මුද්‍රිත අනුක්‍රමික අංකිත මිලදී ගත් ඇණවුම භාවිතා කරයි. කෙසේ වෙතත් මේවන විට ප්‍රදානය කිරීමේ ලිපියෙන් ලංසුකරුවන්ගේ කැමැත්ත ලබාගෙන ඇත. | බැංකුව සහ ලංසුකරු අතර විධිමත් කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ට අනුව විධිමත් පිළිගැනීමේ ලිපියක් සකස් කිරිමට කටයුතු කළ යුතුය. |
| 8.12.1 වගන්තිය | අතුරු හා අවසාන ගෙවීම් සිදු කිරීම සඳහා වැඩ කටයුතු නිසි ලෙස අධීක්‍ෂණය කර තක්සේරු කර ඇත්දැයි සහතික කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | කොන්ත්‍රාත්තුවේ වටිනාකම සලකා බැලීමෙන් පසුව අධීක්ෂණ කටයුතු සඳහා බාහිර විශේෂඥයින් බඳවා ගැනීම ප්‍රායෝගික නොවේ. එබැවින් එළදායි පිරිවැය ක්‍රමයක් ලෙස තක්සේරු නිලධාරීන් සහ මානව සම්පත් අංශයේ නිලධාරින් විසින් එවැනි වෙන්කිරීමේ කටයුතු සමීපව අධීක්ෂණය කර සහතික කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ. | අන්තර් හා අවසාන ගෙවීම් සිදු කිරීම සඳහා, වැඩ කටයුතු නිසි ලෙස අධීක්‍ෂණය කර තක්සේරු කර ඇත්දැයි සහතික කිරීමට සාක්ෂි නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය රුපියල් 244,472,029 ක් වූ අතර 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රුපියල් 178,524,309 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රුපියල් 65,947,720 කින් වැඩිවී තිබු අතර මේ සඳහා පොළී වියදම හා පෞද්ගලික වියදම්, පොළී ආදායමට සාපේක්ෂව වැඩි වී තිබීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් ප්‍රවනතා විග්‍රහය

පොළී ආදායම පසුගිය වර්ෂය හා සමඟ සැසඳීමේදී රුපියල් මිලියන 780 කින් වැඩි වී තිබූ අතර එම වැඩිවීම සියයට 16 ක් විය. මේ සඳහා ණය හා අත්තිකාරම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 1.5 කින් එනම් සියයට 4 කින් වැඩි වීම් හේතු වි තිබුණි. එසේම පොළී වියදම රුපියල් මිලියන 476 කින් එනම් සියයට 15 කින් වැඩි වි තිබූ අතර මේ සඳහා පරිභෝගික තැන්පතු රුපියල් මිලියන 652 කින් එනම් සියයට 1.9 කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් වැඩි වීම හේතු වි තිබුණි. පෞද්ගලික වියදම් රුපියල් මිලියන 99 කින් එනම් සියයට 14 කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වි තිබූ අතර මේ සඳහා නව සමූහික ගිවිසුම අනුව සේවකයින්ගේ වැටුප් වැඩි විම හේතු වි තිබුණි.

### 2.3 ගිණුම්කරණ අනුපාත විග්‍රහය

බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශ අනුපාත හා සසඳන විට සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාතයන් පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| අනුපාතය | බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශ අනුපාත 2018 (%) | 2018 (%) | 2017 (%) |
|---|---|---|---|
| කොටස් මත ප්‍රතිලාභ (ROE) | 7.7 | 4.82 | 3.62 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 0.8 | 1.13 | 0.98 |
| ශුද්ධ පොලී ආන්තිකය | 3.2 | 4.72 | 4.66 |

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව 2018 දෙසැම්බර් 31 දිනට කොටස් මත ප්‍රතිලාභ (ROE) සහ වත්කම් මත ප්‍රතිලාභ (ROA) පිළිවෙලින් සියයට 1.2 සහ සියයට 0.15 කින් ඉහළ ගොස් තිබේ.

(ආ) 2018 වර්ෂය සඳහා ශුද්ධ පොලී ආන්තිකය සියයට 4.72 ක් වන අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ අනුපාතය වන සියයට 3.2 ට වඩා මඳක් ඉහළින් පවතී.

(ඇ) අර්ථ සාධක ණය ඇතුළුව බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය, සියයට 4.8 ක් වන අතර එය බැංකු අංශ අනුපාතයට වඩා බෙහෙවින් වැඩි වේ. මෙයට හේතුව වන්නේ අර්ථ සාධක ණය කාණ්ඩයේ සියයට 65 ක ඉහළ අක්‍රිය ණය අනුපාතයකි. අර්ථ සාධක ණය නොමැතිව දළ අක්‍රිය ණය අනුපාතය 2018 දී සියයට 7 ක් වන අතර එය බැංකු අංශයේ සාමාන්‍ය අනුපාතය වන සියයට 2.2 ට වඩා ඉහළ අගයක් ගනී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ආර්ථික නොවන ගණුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකරන අදහස් | නිර්දේශය |
|---|---|---|
| කිරිබත්ගොඩ ශාඛාවේ කොටස් කිරිම් හා ඉදිකිරීම් කටයුතු සඳහා 2017 මාර්තු මාසයේදී බැංකුව රුපියල් මිලියන 1.16 ක් වියදම් කර ඇත. කෙසේ වෙතත්, කොටස් කිරීමේ කටයුතු අවසන් වී මාස නවයක් වැනි කෙටි කාලයක් තුළදී, එනම් 2018 ජනවාරි මාසයේදී ශාඛාව නව පරිශ්‍රයක් වෙත මාරු කර ඇත. එබැවින් කොටස් කිරීම සඳහා දැරූ වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | තොරතුරු තාක්ෂණ අංශයේ ඩී.ආර්. වැඩ නිම කිරීමෙන් පසු දේපල හිමිකරු, තම දේපළ විකුණා ඇති බව බැංකුවට දන්වා මාස 3 ක් ඇතුළත ගොඩනැගිල්ල පුරප්පාඩු කරන ලෙස දන්වා තිබේ. | ගිවිසුමට අවශ්‍ය වගන්ති ඇතුළත් කිරිමට හා මෙවැනි තීරණ ගැනීමට පෙර අනෙක් පාර්ශවය සමඟ සාකච්ඡා කිරිමට කටයුතු කල යුතුය. |

## 3.2 හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2016 සැප්තැම්බර් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුළ බැංකුවේ ණය අංශය විසින් ව්‍යාජ පෞද්ගලික සංවිධාන දෙකක සේවකයින් ලෙස පෙනී සිටි අයදුම්කරුවන් හතළිස් හතක් (47) සඳහා රුපියල් මිලියන 68.34 ක ණය ලබා දී ඇත. ව්‍යාජ සංවිධාන දෙකෙහි සේවකයින් ලෙස පෙනී සිටින අයදුම්කරුවන් අදාළ ණය සඳහා අයදුම් කිරීමේදී ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය විය. ඉහත ණය මුදලේ මුළු මුදල 2018 දෙසැම්බර් 31 දින අක්‍රීය ණය ශේෂයට ද ඇතුළත් කර තිබුණි. | මෙහි සඳහන් ණය අදාළ වැරදිකරුවන්ගෙන් අය කර ගැනීම බැංකුව විසින් රහස් පොලිසියට පවරා ඇත. | එම මුදල අය කර ගැනීම සඳහා වැරදිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතුය. |

## 3.3 කළමණාකරනයේ අකාරක්ෂමතාවය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි කුලිය ලෙස රුපියල් 38,312,700 ක් ගෙවා තිබුණද, කාර්යාලයේ වාහන නැවැත්වීමේ ඉඩකඩ, වැසිකිලි පහසුම්, දිවා ආහාර ලබා ගැනීමේ ස්ථානය, ගබඩා, විදුලි රැහැන් පරිපථ පද්ධති වැනි බොහෝ පහසුකම්, ගොඩනැගිල්ල ඉතා පැරණි බැවින් සතුටුදායක මට්ටමක නොමැත. කෙසේ වෙතත්, කුලී ගිවිසුමේ විධිවිධාන අනුව රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට බැංකුව අපොහොසත් වී තිබේ. එම නිසා කාර්ය මණ්ඩලය, වත්කම් සහ ගණුදෙනුකරුවන්ගේ ආරක්ෂාව අවදානමට ලක්ව ඇත | බැංකුවේ ඉල්ලීම පරිදි මුදල් අමාත්‍යාංශය විසින් නව ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා කැබිනට් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටුවක් (TEC) පත් කරන ලදි. එසේ වුවත් ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිල්ලක් තෝරාගෙන ඔවුන්ගේ නිර්දේශය 2018 ඔක්තෝබර් මාසයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇතත්, මෙතෙක් අපට නව ගොඩනැගිල්ල සඳහා කැබිනට් මණ්ඩලයේ තීරණය ලැබී නැත. | කැබිනට් මණ්ඩලයේ තීරණය ලැබීමෙන් පසු බැංකුවේ නව ගොඩනැගිල්ල මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමණාකරනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| මූලික බැංකු විසඳුම (core banking solution) මිලදී ගැනීමේ ක්‍රියාවලිය 2016 ජුනි මාසයේ ආරම්භ වුවද, විගණන දිනය දක්වා මූලික බැංකු විසඳුම (core banking solution) මිලදී ගැනීමට බැංකුවට නොහැකි විය. තවමත් එම ක්‍රියාවලිය ආරම්භක අවධියේ පවතී. | මූලික බැංකු විසඳුමක් මිලදී ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් 2019.03.01 දින අමාත්‍යාංශගත තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) පත් කරන ලදි. තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) විසින් එෆ් ආර් එස් සහ ආර් එෆ් පී සහ පුවත්පත් දැන්වීම අනුමතිය සඳහා 2019 සැප්තැම්බර් 23 දින අමාත්‍යාංශයට ලබා දී ඇත. | බැංකුවේ මූලික බැංකු විසඳුම මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 467 ක් වූ අතර 2018 වර්ෂය අවසන් වන විට බැංකුව සේවකයින් 389 ක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 වන විට පුරප්පාඩු 78 ක් ඉතිරිව තිබේ. බැංකුවේ සුමට ක්‍රියාකාරීත්වයට බලපාන ප්‍රධාන කළමනාකරණ තනතුරු 09 ක් පුරප්පාඩුව තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. | පුරප්පාඩු වූ තනතුරු අතුරින්, ඩී.එම්.ජී. (ණය) , ඒ.ජී.එම්. (අයකර ගැනීම්), ඒ.ජී.එම් (එච්.ආර්. සහ එල්) සහ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී 2019 වර්ෂය තුළ පුරවා ඇති අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ ඇති පුරප්පාඩු පිරවීම සඳහා දැන්වීම් පළ කර ඇත. | බැංකුවේ කටයුතු සුමටව සිදු වන බව සහතික කිරීමට අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුර වසර පහකට වැඩි කාලයක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම වසර තුළ කිහිප වතාවක්ම ජාතික පුවත්පත්වල පුරප්පාඩුව පිළිබඳව බැංකුව විසින් දැන්වීම් පළ කර ඇති අතර පසුගිය වසරේදී ලැබුනු ඉල්ලුම්පත් ලැබී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද තොරතුරු තාක්ෂණික සුදුසුකම් සපුරා නොවේ. බැංකුවේ ස්ථාවරය පිළිබඳව බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත දැනුම් දී ඇති අතර බැංකුවේ බඳවා ගැනීමේ පටිපාටියට (SOR) අනුව අයදුම්පත් කැඳවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ කැමැත්ත ලබාගෙන ඇත. | ශ්‍රී ලංකා මහ බැංකුවේ කැමැත්ත ලැබී ඇති හෙයින් බැංකුවේ යහපාලනය පවත්වා ගැනීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පුරප්පාඩුව පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |